# ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදූව

**DIVISIONAL SECRETARIAT – HABARADUWA**

ප්‍රාදේශීය ලේකම්
பிரதேச செயலாளர்
Divisional Secretary

## <u>ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් දේශීය ආදායම් පනතේ 102 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම</u>

2024 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එදිනට හෝ එදිනට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයින් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීම අනිවාර්යය වේ.

තවද, තක්සේරු වර්ෂයක් (එක් වර්ෂයක අප්‍රේල් මස 01 වන දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු 31 වන දින දක්වා) සඳහා යම් තැනැත්තෙකු රු 1,200,000/- ට වැඩි ආදායමක් ලබන්නේ නම්, ආදායම් බද්ද සඳහා ද ලියාපදිංචි විය යුතුය.

ඉහත පරිදි, ලියාපදිංචි නොවන තැනැත්තක් දේශය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරවීමට කටයුතු කරනු ලබන අතර, රු 50,000 නොඉක්මවන දණ්ඩනයකට ද යටත් විය යුතුය.

ඉහත ලියාපදිංචියට අදාළ අතිවිශේෂ ගැසට් පත්‍රය පහත දිගුවට යොමු වීමෙන් බාගත කරගත හැකිය.

http://www.ird.gov.lk/si/publications/sitepages/gazette.aspx?menuid=1602

## ලියාපදිංචිය සඳහා අයදුම් කරන ආකාරය

**1. මාර්ගගත ලියාපදිංචිය:**

**www.ird.gov.lk** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස පහත පරිදි කටයුතු කරන්න. තවද, ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සඳහා පහත සැබැදියට යොමු වන්න.

**http://www.ird.gov.lk/si/eServices/sitepages/Registration.aspx?menuid=180101**

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 'ඊ - සේවාව වෙත පිවිසීම' වෙත පිවිස 'බදු ගෙවන්නා ලියාපදිංචිය' තෝරන්න.

- අදාළ කාණ්ඩය තෝරා සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කරන්න.

- අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු, ඔබගේ ඉල්ලීම සමාලෝචනය කරනු ඇත.
- පසුව බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය(TIN) සඳහන් සහතිකයක් සහ එක්වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදයක්(PIN) ලබා දී ඇති ඊමේල් ලිපිනය වෙත ලැබෙනු ඇත.
- ඒ අනුව කටයුතු කිරීමෙන්, ඔබ සඳහා වන මාර්ග ගත පහසුකම් සහිත වෙබ් ගිණුම නිර්මානය කරගත හැකිය.

**නැතහොත් පහසුවෙන්ම ලියාපදිංචිය සඳහා පහත QR කේතය හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ-පෝර්ටලය වෙත පිවිසිය හැකිය.**

## ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන ලේඛන

- ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය/ වැඩිහිටි හැඳුනුම්පත
- ඔබගේ ස්ථිර ලිපිනය ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනයට වඩා වෙනස් නම්, අදාළ ලිපිනය තහවුරු කිරීම සඳහා ඔබගේ නමට නිකුත්කල ජල හෝ විදුලි බිල්පතක්/ ස්ථාවර දුරකතන බිල්පතක්/ ග්‍රාම සේවක සහතිකයක්
- ඔබ ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරුවෙක් නම්, අදාළ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය.